# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,200 — 1962 ජූලි 6 වැනි සිකුරාද — 1962.7.6

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | 405 |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම:—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 406 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 416 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම

### දකුණු පළාත

ඉඩම් කොමසාරිස්ගේ අංකය : 4/7/1259
දිසාපතිගේ අංකය : එල්ඊ/ඒ26

**ඉලක්කම 124.**—දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1962 අගෝස්තු 23 වෙනි දින වූ බ්‍රහස්පතින්ද පෙරවරු 10 ට හම්බන්තොට කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දු කරන්ට යෙදෙනවා ඇත.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවා පත්තුවේ මිණිඇතිලිය ගම්මුලාදෑනි කොට්ඨාශයේ පිහිටා තිබෙන බිම් කැබලි හතර (4) ක්.

| මුල් සිතියමේ නොම්මරය | බිම් කැබෙල්ලේ නොම්මරය | ඉඩමේ නම | ගම | ඉල්ලුම්කාරයාගේ නම | අයිතිකම කියාහිටින අයගේ නම | කොයි අන්දමේ ඉඩමක්ද යන වග | ප්‍රමාණය | අක්කරයක කස්තෝරු මිළ |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | අ. රූ. ප. | රු. ශ. |
| අ. ග. සැ. 460 | 81 | දොස්තර කුඹුර | මිණිඇතිලිය | ඩී. ඒ. ඩබ්ලිව්. මුණිවර | ඩී. ඒ. ඩබ්ලිව්. මුණිවීර | කුඹුරු ඉඩම | 0 1 11 | 800 0 |
| | 84 | අක්කර විස්ස කුඹුර | මිණිඇතිලිය | එච්. එච්. තෝමස් සිල්වා | එච්. එච්. තෝමස් සිල්වා | කුඹුරු ඉඩම | 0 2 35 | 800 0 |
| | 85 | මිණිඇතිලිය වැවකුඹුර | මිණිඇතිලිය | ඇස්. වීරවර්ණ | ඇස්. වීරවර්ණ | කුඹුරු ඉඩම | 0 0 03 | 800 0 |
| | 86 | අක්කර විස්ස කුඹුර | මිණිඇතිලිය | එච්. එච්. තෝමස් සිල්වා | එච්. එච්. කෝමස් සිල්වා | කුඹුරු ඉඩම | 0 2 21 | 800 0 |

ඉඩම් කොමසාරිස් කායාලය,
කොළඹ,
1962.7.6.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

7–71—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

### විශේෂ නිවේදනයයි

නිෂ්පාදන වියදම් අධිකවීමේ හේතුන් නිසා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීමේ ගාස්තු වැඩි කිරීමට තීරණය කර ඇත. දැනට පවතින පළමුවන අඟලට රු. 10 ක් සහ වැඩිවන සෑම අඟලක් සඳහා රු. 5 බැගින් අයකරනු ලබන ගාස්තුව වෙනුවට, 1962 ජූලි මස 16 වෙනි දින සිට වෙළඳ ලකුණු දැන්වීම් හැර අන් සියළුම දැන්වීම් සඳහා තනි තීරුවේ සෑම අඟලකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින්ම අයකරනු ලබන බව සෑම දෙනාගේම දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1962, ජූනි මස 29 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

# ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

**38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥව**

**1962 අංක 243 දරන ආඥව**

**යොමු අංකය : ජේ. 60/61 එන්එස් 65.—ආර්/කිව් 322.**

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962 ජූනි මස 6 වන දින,
කොළඹ.

### උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| කොළඹ දිසාවේ අතිරේක දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියා. | කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, කෝට්ටේ පළාත් අණ්ඩු සභාවේ අංක 6 දරණ කොට්ඨාශය තුළ, පිටකෝට්ටේ ගම්මුලාදෑණි වසමේ පිහිටි පාගොඩ පාරේ වරිපණම් අංක 132 දරණ ප්‍රමාණයෙන් පර්චස් 17 ක් පමණ විශාල වූ රේමන්ඩ් වත්ත නොහොත් ගල් අම්බලම ළඟ වත්ත නමැති ඉඩමේ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කැබෙල්ල :— උතුරට : පාගොඩ පාර ; නැගෙනහිරට : පාගොඩ පාරේ වරිපණම් අංක 138, 146 සහ 148 සහ කෝට්ටේ පාරේ වරිපණම් අංක 433, 435 සහ 437 දරණ මෙම ඉඩමේ කොටස් ; දකුණට : මෙම ඉඩමේ අනික් කැබලි වලට යාම සඳහා වෙන් කර ඇති අඩි 20 ක් පළල පාර ; බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස. |

7–18—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥව**

**1962 අංක 248 දරන ආඥව**

යොමු අංකය : ජේ. 60/61 එල්. 342 (වී.ඊ.)—එල්.බී. 2497.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962 ජූනි මස 6 වැනි දින,
කොළඹ.

### උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| මාතර දිස්ත්‍රික්කයේ දිසාපති හෝ ඔහුගෙන් බලයලත් වෙනත් නිලධාරියෙක් | (1) මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ කපුගම බටහිර ගම්මුලාදෑනි වසමේ ගන්දර වත්තේ පිහිටි වෙරලු ගහ කොරටුවේ තොටුපලවත්ත නමැති, ප්‍රමාණයෙන් අ. 7, රූ. 3, ප. 10 ක් පමණ වූ, පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම :— උතුරට : ග්‍රාම සංවර්ධන පාර ; නැගෙනහිරට : ග්‍රාම සංවර්ධන පාර, එච්. ජී. මිනිමෙල් අයිතිකම් කියන එම ඉඩමේම කොටසක්, එච්. කේ. සාදිනා සහ තවත් අය අයිතිකම් කියන තොටුපල වත්ත සහ සී. සී. වික්‍රමසේකර අයිතිකම් කියන පුන්චිහාල්කොන්සෙ ගොඩැල්ල ; දකුණට : සී. ඇම්. ශ්‍රෙරෝ අයිතිකම් කියන නුගගහ වත්ත ; බස්නාහිරට : කේ. එම්. සර්නේලිස් සහ තවත් අය අයිතිකම් කියන පුවක්ගස්ආරෙ වත්ත සහ එච්. කේ. නිමලාවතී අයිතිකම් කියන ආරෙ වත්ත.<br><br>(2) මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කපුගම බටහිර ගම්මුලාදෑනි වසමේ, ගන්දරවත්තේ පිහිටි, ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 35 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි පාර :— උතුරට : එච්. කේ. සෝමපාල අයිතිකම් කියන පුවක්ගහඹිවිට හෙවත් කුරුඳුතොටවත්ත දෙනිය සහ ඒ. එච්. පී. එච්. ඔච්සනෝනා අයිතිකම් කියන වෙරලුගහකොරටුව ; නැගෙනහිරට : ඒ. එච්. පී. එච්. ඔච්සනෝනා අයිතිකම් කියන වෙරලුගහකොරටුව ; දකුණට : ඒ. එච්. පී. එච්. ඔච්සනෝනා අයිතිකම් කියන වෙරලුගහකොරටුවෙ තොටුපලවත්ත ; බස්නාහිරට : එච්. කේ. නිමලාවතී අයිතිකම් කියන ආරෙවත්ත. |

7–694—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

### 1962කෝ් අංක 245 දරන ආඥාව

යොමු අංකය : ජේ. 58/59 එල්. 462 (වී.ඊ)—ඇල්.එච්. 593.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම, සවාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962 ජූනි මස 6 වැනි දින,
කොළඹ.

#### උපලේඛනය

**I**

**ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා**

කෑගල්ල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරියා හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක්

**II**

**ඉඩමේ විස්තරය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ සහ කිනිගොඩ කෝරළයන්හි, දෙයාලි දහමුනු පත්තුවේ, කොළොන්ගොල්ල සහ දිඹුල්ගමුව ගම්වල පිහිටි ග්‍රෙස්ලින් වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 61, රූ. 1, ප. 25ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :—

උතුරට : ඊ. ජී. කිරිබණ්ඩා හිමිකම් කියන ආරාමනාහිඟුර නමැති ඉඩම, ඇස්. ඇම්. සමරකෝන් බණ්ඩා හිමිකම් කියන බුලානා නමැති ඉඩම, ඇම්. ඇම්. ආර්. සේනාරත්න සහ තවත් අයෙක් හිමිකම් කියන දොඹගත්තැන්න නමැති ඉඩම, ඒ. මාදන මහත්මිය සහ ඇම්. කේ. මාදන හිමිකම් කියන දොඹගත්තැන්නෙ වත්ත නමැති ඉඩම සහ දොඹගත්තැන්නෙකුඹුර නමැති ඉඩම ; නැගෙනහිරට : ඇළ සහ මෙම ඉඩමේම කොටසක් (අත්කර ගැනීම යටතේ ඇති) ඇම්. බී. ඇම්. සෙනෙවිරත්න හිමිකම් කියන කැන්දෙගොල්ලවත්ත නමැති ඉඩම, ඇන්. එච්. කරුණාරත්න හිමිකම් කියන රන්දෙනියවත්ත නමැති ඉඩම, ඊ. ආර්. මාදන සහ ඇම්. සෙනෙවිරත්න හිමිකම් කියන ගුරුමුදුනෙවත්ත නමැති ඉඩම සහ ප්‍රසිද්ධ පාර ; දකුණට : ඊ. ආර්. මාදන හිමිකම් කියන ගුරුමුදුනෙකුඹුර නමැති ඉඩම, ඇළ, ඩබ්ලිව්. අයි. විකිරියා සහ තවත් අය හිමිකම් කියන හුන්නෙමුල්ලෙකුඹුර නමැති ඉඩම, ඩී. ජී. රනා සහ තවත් අය හිමිකම් කියන හුන්නෙමුල්ලෙකුඹුර නමැති ඉඩම, ඩබ්ලිව්. ඇෆ්. සුන්දරා සහ තවත් අය හිමිකම් කියන පොල්ගස්කැල්ල නමැති ඉඩම, ඇළ, ඩබ්ලිව්. ධර්මසේන හිමිකම් කියන හුනුගෙදෙනිය නමැති ඉඩම, ඩී. ජී. උන්ගා හිමිකම් කියන අස්වැද්දුමෙකුඹුර නමැති ඉඩම, ඇස්. එච්. ඇල්පියා හිමිකම් කියන ඇස්වැද්දුමෙකුඹුර නමැති ඉඩම, ඇළ, ඩබ්ලිව්. ඇස්. ගුණරත්න හිමිකම් කියන කහටකොස්ගහමුලහේන නමැති ඉඩම සහ එච්. කිරිඳුරයා හිමිකම් කියන ඉපිටහවත්ත නමැති ඉඩම ; බටහිරට : ගම්සභා පාර, එච්. සයිමන් සහ තවත් අය හිමිකම් කියන පාළුවත්ත නමැති ඉඩම, එච්. හොරතලා හිමිකම් කියන කජුකොටුව නමැති ඉඩම, කේ. ඩී. සිරිමලා සහ තවත් අය හිමිකම් කියන කැකිරිවත්ත නමැති ඉඩම, එච්. පී. සියාතුවා හිමිකම් කියන පැන්මදිතැන නමැති ඉඩම, එච්. පී. ලම්දුවා සහ තවත් අයෙක් හිමිකම් කියන ආරාමනාහිඟුර නමැති ඉඩම, එච්. පී. රන්කිරා හිමිකම් කියන පහලවත්ත නමැති ඉඩම සහ එච්. පී. රන්කිරා, ආර්. පී. සේතුවා සහ ඊ. ජී. කිරිබණ්ඩා හිමිකම් කියන ආරාමනාහිඟුර නමැති ඉඩම.

(2) කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ සහ කිණිගොඩ කෝරළයන්හි, කොළොන්ගොල්ල නමැති ගමේ පිහිටි ග්‍රෙස්ලින්වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 15, රූ. 0, ප. 17 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :—

උතුරට : ඒ. මාදන මහත්මිය සහ ඇම්. කේ. මාදන හිමිකම් කියන දොඹගත්තැන්නෙකුඹුර නමැති ඉඩම, ඒ. මාදන මහත්මිය සහ ඇම්. කේ. මාදන හිමිකම් කියන දොඹගත්තැන්නෙවත්ත නමැති ඉඩම සහ නියදගලහේන ; නැගෙනහිරට : ඇටලියදෙනිය ඇළ දිගේ ඇති රක්ෂිත බිම සහ ඇන්. එච්. කරුණාරත්න හිමිකම් කියන රන්දෙනියවත්ත නමැති ඉඩම ; දකුණට : ඇම්. බී. ඇම්. සෙනෙවිරත්න හිමිකම් කියන කැන්දගොල්ලෙවත්ත නමැති ඉඩම ; බටහිරට : මෙම ඉඩමේම කොටසක් (අත්කරගැනීම යටතේ ඇති) ඇළ.

(බදු අයිතිය අත්කර ගනු ලැබේ).

7–16—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1962 අංක 247 දරන ආඥාව

යොමු අංකය : ජේ. 58/59 එල්. 148 (වී.ඊ.)—ඇල්.ඒ. 3689.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම, සවාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962 ජූනි මස 6 වැනි දින,
කොළඹ.

#### උපලේඛනය

| I | II |
|---|---|
| **ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා** | **ඉඩමේ විස්තරය** |
| පුත්තලම දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක් | අංක ඒ 1,727 දරණ මූලික සැලැස්මේ 1 වෙනි බිම් කැබැල්ල |

6–17—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1962 අංක 246 දරන ආඥාව

යොමු අංකය: ජේ. 57/58 එල්. 581 වීජී—2/10/109.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

කොළඹ,
1962 ජූනි මස 6 වන දින.

#### උපලේඛනය

| I<br>ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
| --- | --- |
| නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරියා හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක්. | ඒ. 2690 දරණ මූලික සැලැස්මේ අංක 1 දරණ ඉඩම් කැබැල්ල. |

6-15—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1962 අංක 283 දරන ආඥාව

යොමු අංකය: ජේ. 60/61. සී. 504.—එල්ඒ/36.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

කොළඹ,
1962 ජූනි මස 23 වැනි දින.

#### උපලේඛනය

| I<br>ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
| --- | --- |
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ උප දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක්. | පහත සඳහන් අයුරු මායිම් වී ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ, බටහිර නුවරගම් පළාතේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, අනුරාධපුර නාගරික මූලාදෑනි තැනගේ වසමේ ඇල්ලකට්ටු පාරේ වරිපනම් අංක 29 දරණ ප්‍රමාණයෙන් අක්කර 0,. රූඩ් 1, පර්. 20 පමණ වූ අවසාන ගම් සිතියම් අංක 1399 යේ කැබලි අංක 17 (කොටසක්) හා 19 (කොටසක්) වශයෙන් පෙන්නුම් කර ඇති ඉඩම :— උතුරට: ඒ. වී. සෝනාධිරාජ මහතා හිමිකම් කියන වරිපනම් අංක 23 දරණ ඉඩම; නැගෙනහිරට: ඩබ්. ඩී. ඉසානිස් අප්පුහාමි මහත්මිය හිමිකම් කියන වරිපනම් අංක 90 දරණ ඉඩම; දකුණට: වී. සෙල්ල දුරෙයි මහතා හිමිකම් කියන වරිපනම් අංක 29 දරණ ඉඩම; බටහිරට: ඇල්ලකට්ටු පාර. |

7-10—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

ඇල්එච්/ඒ. 5011.

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

(1) පහත සඳහන් මායිම් තුළවූ කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්දුන් කෝරළයේ ඕවිටිගල ගමේ පිහිටි අක්කර 5ක් පමණ ප්‍රමාණය ඇති ක්ලැරන්ස්හිල් වත්ත නම් (වි ජී 190353) දරණ ඉඩම :—

උතුරට: බදුගම ඇල; නැගෙනහිරට: බදුගම ඇල සහ පී පී 16684 දරණ සැලැස්මේ අංක 5 සහ 6 දරණ බිම් කට්ටි; දකුණට: පී පී 16684 දරණ සැලැස්මේ අංක 1, 3 සහ 4 දරණ බිම්කට්ටි; බටහිරට: බදුගම ඇල සහ පී පී 16684 දරණ සැලැස්මේ අංක 1 සහ 2 දරණ බිම් කට්ටි.

2: පහත සඳහන් මායිම් තුළවූ කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්දුන් කෝරළයේ ඕවිටිගල ගමේ පිහිටි එකමගොඩවත්ත නම් අක්කර 5ක් පමණවූ වි. පී. 184340 දරණ බිම්කට්ටිය :—

උතුරට: පී පී 16684 දරණ සැලැස්මේ අංක 3 සහ 5 දරණ බිම් කට්ටි සහ විල්මට් පෙරේරා මහතා හිමිකම් කියන ස්වර්ණකාන්දේ කොටසක්; නැගෙනහිරට: හොරවල ගම් මායිම සහ පී පී 16684 දරණ සැලැස්මේ අංක 5 දරණ බිම් කට්ටිය; දකුණට: හොරවල ගම මායිම; බටහිරට: ඒමිස් පෙරේරා හිමිකම් කියන හන්දිය වත්ත සහ විල්මට් පෙරේරා හිමිකම් කියන ස්වර්ණකාන්දේ කොටසක්.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය: ජේ 61/62 එල් 42 (වීජී).

1962 මැයි මස 26 වැනි දින,
කොළඹ දීය.

7-19—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1962 අංක 249 දරන ආඥාව

යොමු අංකය: ජේ. 60/61 එල්. 395 වී.ඊ.—කිව්.බී. 521.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II. වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, සවාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962 ජූනි මස 6 වැනි දින,
කොළඹ.

### උපලේඛනය

| I | II |
|---|---|
| ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා | ඉඩමේ විස්තරය |
| කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති හෝ ඔහු ගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක් | කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ උතුර "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මාර පොල ගමේ පිහිටි කොරොසෙවත්ත නොහොත් දොලේවත්ත නමැති ප්‍රමාණයෙන් අ. 35, රූ. 3, ප. 37.6 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම :— උතුරට: උඩුගම්පොල සිට දිවුලපිටිය දක්වා ඇති ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට: වයි. ඒ. හෙන්රි යාපා සහ තවත් අයෙක් හිමිකම් කියන සිල්වතැන්න නොහොත් නිහාල්වත්ත නමැති ඉඩම, ඇළ, බැස්ටියන් ජයකොඩි සහ තවත් අය හිමිකම් කියන ගල්වලකුඹුර නමැති ඉඩම, වයි. ඒ. කරුණාරත්න හිමිකම් කියන අඹගහවත්තේපිල්ලැව නමැති ඉඩම, ඩබ්ලිව්. ජයකොඩි සහ තවත් අය හිමිකම් කියන අඹගහකුඹුර නමැති ඉඩම, වයි. ඒ. කරුණාතිලක හිමිකම් කියන හල්ගහකුඹුර නමැති ඉඩම, වයි. ඒ. හෙන්රි යාපා සහ තවත් අයෙක් හිමිකම් කියන අඹගහවත්ත නමැති ඉඩම, ඇම්. පී. බුම්පි සිංඤෝ සහ තවත් අය හිමිකම් කියන අඹගහවත්ත නමැති ඉඩම, ඇම්. පී. එන්ගොහාමි සහ තවත් අය හිමිකම් කියන අඹගහවත්ත නමැති ඉඩම සහ ඇන්. සින්චියා සහ තවත් අය හිමිකම් කියන දෙමටගහවත්ත නමැති ඉඩම; දකුණට: ඇන්. මානික්කුවා හිමිකම් කියන කෝන්ගහවත්ත නමැති ඉඩම සහ ඇන්. පී. පින්ටෝ සහ තවත් අය හිමිකම් කියන කළුගහලන්ද නමැති ඉඩම; බටහිරට: ඇළ, ඇන්. බැස්ටියන් හිමිකම් කියන කරව්ගහමුල පිල්ලැව නමැති ඉඩම, ඇන්. සිරිසේන හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම, ඇන්. පියරත්න සහ තවත් අය හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම, ඇන්. ගුණසිරි සීලම්මා හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම සහ පාර. |

7-14—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

### "460 වැනි පරිච්ඡේදය"

පහත විස්තර කරන ඉඩම මහජන කායසියක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් ඉත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මාරස්සන ගම්මුලාදෑනි වසමේ, මාරස්සන පිහිටි බෝගහපිටිය නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 13 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

උතුරට: පාර සහ මෙම ඉඩමේම කොටසක්; නැගෙනහිරට: මෙම ඉඩමේම ඉතිරි කොටස; දකුණට: ඇළ සහ මෙම ඉඩමේම කොටසක්; බටහිරට: මෙම ඉඩමේම ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමති.

සඳහන් අංකය: 59/60 එල් 722 (වී.ඊ.)/එල්/සී./බී. 82

1962 ජූනි මස 14 දින,
කොළඹදිය.

7-105—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

### 5වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (I) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:—

මහනුවර දිස්ත්‍රික්කයේ, මැද දුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මැදසිය පත්තුවේ, දොරලියද්ද ගම්මුලාදෑනි වසමේ, ගුරුඔය ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 325, රූ. 2, පර්. 19ක් පමණවූ මහබේරිය තැන්න වත්තේ දෙනියගල කොටස නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම:

උතුරට: අයි. ෆ්‍රැන්සිස් සිල්වා සහ තවත් අය හිමිකම් කියන ගුරුලෑකඳුරහේන නමැති ඉඩම, අයි. ෆ්‍රැන්සිස් සිල්වා සහ තවත් අය හිමිකම් කියන ගුරුලෑකඳුරලගහේන නමැති ඉඩම. ආර්. ප්‍රේමදාස සහ ආර්. කරුණාවතී හිමිකම් කියන ගුරුලෑව කන්දේවත්ත නමැති ඉඩම, ආර් බිලිඳා හිමිකම් කියන ගුරුලෑ කඳුරෙවැකන්දවෙත්ත නමැති ඉඩම, ආර්. බිලිඳා සහ තවත් අය හිමිකම් කියන කුඩුගහරුප්පෙ මායිම ගාව හේන නමැති ඉඩම සහ රජයේ ඉඩම; නැගෙනහිරට: කුඩුගහරුප්පෙ පතන නමැති ඉඩම "රජය සතු" ඊ. ඇම්. උක්කුවා හිමිකම් කියන මීගහ උල්පොතහේන නමැති ඉඩම, මීගහපොතේකඳුර නමැති ඉඩම, කේ. නන්දෝරිස් හිමිකම් කියන ගව් ඇල ගල්වඩිගාව වත්ත නමැති ඉඩම, කේ. නන්දෝරිස්, එච්. ගුණවර්ධන සහ තවත් අය හිමිකම් කියන ගව්ඇලහේන නමැති ඉඩම සහ රජයේ ඉඩම; දකුණට: පින්නකැටියහේන්යාය නමැති ඉඩම "රජය සතු" සහ මාලබොඩගලකඳුර; බටහිරට: මාලබොඩගලකඳුර සහ හුළුගඟ.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය: ජේ 61/62 එල් 64 (වීඊ) ඇල්සී/ඇජ්/31.

1962 ජූනි මස 14 වැනි දින,
කොළඹදීය.

7-146—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ තලවකැලේ-ලිඳුල පළාත් ආණ්ඩු සභාවේ අංක 5 දරණ කොට්ඨාශයේ මිඩ්ල්ටන්හි (කොටසක්) පිහිටි මිඩ්ල්ටන් වත්තෙන් අ. 1, රූ. 2, ප. 25.2ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටසට මායිම් :—

උතුරට: තලවකැලේ-නුවරඑළිය ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට: තලවකැලේ-නුවරඑළිය ප්‍රසිද්ධ පාර සහ රජයේ ඉඩම; දකුණට: කුම්බ්වුඩ් වත්ත; බස්නාහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක: ජේ. 56 එස් 18.

1962 මැයි 11 දින,
කොළඹදීය.

7–46 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (I) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කපුහෙම්පොල ගම්මුලාදැනි වසමේ, කපුහෙම්පොල නමැති ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 5, රූ. 3, ප. 0 ක් පමණ වූ කැරන්විල හේන නොහොත් ජයවික්‍රමහේන සහ හත්හවුල් නොහොත් අටහවුල් කුඹුර නමැති ඉඩම් වලින් පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් කැබැලි තුනට මායිම් :—

**(අ) කැරන්විලහේන නොහොත් ජයවික්‍රමහේන: ප්‍රමාණය අක්කර 5 ක් පමණ :—**

උතුරට: එම ඉඩමේ කොටසක්; නැගෙනහිරට: අක්මීමන, කපුහෙම්පොල පී. යූ. ගොඩගේ අයිතිකම් කියන කැරන්විල අද්දර කුඹුර නැමැති කුඹුර සහ හත්හවුල් නොහොත් අටහවුල් කුඹුරෙන් කොටසක් (රජයට අත්කර ගැනීමට අදහස් කරන); දකුණට: අක්මීමන, කපුහෙම්පොල පී. යූ. ගොඩගේ අයිතිකම් කියන කැකුණගහවත්ත නමැති ඉඩම; බස්නාහිරට: එම ඉඩමේ කොටසක්.

**(ආ) හත්හවුල් නොහොත් අටහවුල් කුඹුර: ප්‍රමාණය: අක්කර 1/4ක් පමණ :**

උතුරට: එම ඉඩමේ කොටසක්; නැගෙනහිරට: කපුහෙම්පොල-වලහන්දුව ගම් සහා පාර; දකුණට: අක්මීමන, කපුහෙම්පොල, පී. යූ. ගොඩගේ අයිතිකම් කියන කැකුණගහවත්ත නමැති ඉඩම; බස්නාහිරට: ඊ. ඇස්. ජයවික්‍රම අයිතිකම් කියන කැරන්විල හේන හෙවත් ජයවික්‍රම හේන.

**(ඇ) කැරන්විලහේන නොහොත් ජයවික්‍රමහේන: ප්‍රමාණය: අක්කර 1/2 ක් පමණ :**

උතුරට: එම ඉඩමේ කොටසක්; නැගෙනහිරට: එම ඉඩමේ කොටසක්; දකුණට: ඒ. කේ. ජයනෝරිස් අප්පුහාමි අයිතිකම් කියන කැකුණහේනදෙනිය නැමැති ඉඩම සහ අක්මීමන කපුහෙම්පොල, පී. යූ. ගොඩගේ අයිතිකම් කියන කැකුණගොඩවත්ත; බස්නාහිරට: කපුහෙම්පොල-ගොඩදූව ගම් සහා පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය: ජේ. 59/60 ඊ 229-ඉට 3/209

1962 ජූනි මස 6 දින කොළඹදීය.

7–28—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් රජයට අත්කරගැනීමේ ආඥපනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

අංකය: ආර්/කිව් 219.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—
මූලික සැලැස්මේ අංකය: ඒ. 4896.
පිහිටීම: කොළඹ දිසාවේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය, මිරිහාන (කොටස).

**කැබැල්ල: 1.**

නම: හල්ගහ කුඹුර; විස්තරය: කුඹුර සහ ඕවිට; අයිතිකම් කියන අයගේ නම: මලවිය ආරච්චිගේ ඒබ්‍රහම් රබෙල්, ජයන්ති මාවත, මිරිහාන, කෝට්ටේ, මලවිය ආරච්චිගේ මාටින් රබෙල්, මලවිය ආරච්චිගේ පීටර් රබෙල්, මලවිය ආරච්චිගේ චාල්ස් රබෙල් සහ කේ. ලුවිසා අල්විස්. සියළුදෙනාම රජමහ විහාර පාර, මිරිහාන, කෝට්ටේ සහ එච්. තෝමස් දාබරේ, එක්වත්ත පාර, මිරිහාන, කෝට්ටේ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 18.2.

**කැබැල්ල: 2.**

නම: වෙදරාලලාගේ මුත්තෙට්ටුව කුරුඳු පිල්ලැව කුඹුර; විස්තරය: කුඹුර සහ ඕවිට; අයිතිකම් කියන අයගේ නාම: සී. ජේ. එදිරිසිංහ "සෝමගිරි", උඩහමුල්ල, නුගේගොඩ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 18.7.

**කැබැල්ල: 3.**

නම: ගෝනගහවත්ත; විස්තර: අවු. 30 වූ පුවක් ගස් දෙකක් ඇති හේන; අයිතිකම් කියන අයගේ නාම: පළාත් ආණ්ඩු සභාව, කෝට්ටේ; අ. 0, රූ. 0, ප. 27.6.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ක්වූ අගෝස්තු මස 21 දින පහත සඳහන් වේලාවන්හි කොළඹ කච්චේරිය ස්ථානයේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1962 ක්වූ අගෝස්තු මස 11 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

| කැබැල්ල | වේලාව |
|---|---|
| 1. | පෙරවරු 10 ට |
| 2. | පෙරවරු 10.15 ට |
| 3. | පෙරවරු 10.30 ට |

වී. පී. ඒ. පෙරේරා,
දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්තතුමා.

1962 ක්වූ ජූනි මස 28 දින,
කොළඹ කච්චේරියේදීය.

7–136—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ගාල්ල දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ වඳුරඹ ගමේ පිහිටි අ. 0, රූ. 0, ප. 21ක් පමණ ප්‍රමාණය වන පහත සඳහන් මායිම් තුළවූ ඕකන්දෙවත්ත නමැති ඉඩමේ බිම් කොටසට මායිම් :—

උතුරට : අංක ඒ 1371 දරණ මූලික සැලැස්මේ කැබලි අංක 7 ; නැගෙනහිරට : කේ. එච්. ලයිරිස් අයිතිවාසිකම් කියන ඕවිලාකෙ ඕවිට නමැති ඉඩම ; දකුණට : ඩබ්ලිව්. අමරසිංහගේ උරුමක්කාරයන් සහ තවත් අය අයිතිවාසිකම් කියන මුත්තෙට්ටුව නමැති ඉඩම ; බස්නාහිරට : අංක ඒ 1371 දරණ මූලික සැලැස්මේ කැබලි අංක 2.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ 58-59 ඇල්.ජී. 119—ඉට/1/57.

1962 පෙබරවාරි 10 දින,
කොළඹදීය.

7–34 62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

අම්පාර දිස්ත්‍රික්කයේ, කරවාහු හා නින්දවූර් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කාරතිව් අංක 1 ගම්මුලාදෑනි කොට්ඨාශයේ පිහිටි අ. 0, රූ. 0, ප. 32 ක් පමණ ප්‍රමාණය ඇති " කන්නච්චි වලවු " නැමැති බිම් කොටසට මායිම් :—

උතුරට : කේ. කනගම්මා සහ තවත් අයෙක් අයිතිකම් කියන ඉඩම ; නැගෙනහිරට : කේ. පොන්නම්බලම් සහ තවත් අයෙක් අයිතිකම් කියන ඉඩම ; දකුණට : කේ. පාසුපතිපිල්ලෙයි නොහොත් කාසිපිල්ලෙයි අයිතිකම් කියන ඉඩම ; බස්නාහිරට : පටු මාවත.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 59/60 එස්. 623.

1962 ජූනි මස 14 දින,
කොළඹදීය.

7–139—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත් එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරලේ, මැද පත්තුවේ තිරිඇල්ල ගමේ පිහිටි ඉඩම්ගොඩ වත්තයාය නැමැති ඉඩමෙන් (අංක 182 දරන අවසාන ගම් සැලැස්මේ කට්ටි අංක 253 න්) අ. 0, රූ. 3, ප. 00 පමණ ප්‍රමාණය ඇති බිම් තීරුවට මායිම් :—

උතුරට : කේ. එස්. ඩී. ධම්දාස සහ තවත් අය අයිතිකම් කියන ඉඩම ; නැගෙනහිරට හා දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; බස්නාහිරට : රත්නපුර-පානදුර ප්‍රසිද්ධ පාරේ ආරක්ෂක බිම් තීරුව (අංක 182 දරන අවසාන ගම් සැලැස්මේ කට්ටි අංක 250).

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ 60/61 එල් ජී 293.

1961 දෙසැම්බර් 14 දින,
කොළඹදීය.

7–140—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් රජය සන්තක කිරීමේ ආඥාපනත (460 වන පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් රජය සන්තක කිරීමේ ආඥාපනතේ (460 වෙනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

බස්නාහිර පලාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ මුන්ගේන යන ගමේ පිහිටි අංක ඒ. 4800 දරණ මූලික සැලැස්මේ අංක 1-3 දරණ බිම් කැබලි.

**කැ. නො : 1.**

ඉඩමේ නම : මිල්ලගහවත්ත ; විස්තරය : අවුරුදු 5 බඩි රබර් ගස් 15 ; අයිතිකරුවෝ : රජය සතුයි. මග්ගොන මාර්කට් ප්ලේස් හි, බී. වී. පී. පෙරේරා විසින් බලහත්කාරයෙන් අල්ලාගෙන ඇත ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 09.6.

**කැ. නො : 2.**

ඉඩමේ නම : මිල්ලගහවත්ත ; විස්තරය : අවු. 20-30 රබර් ගස් 5 යි ; අයිතිකරුවෝ : රජය සතුයි. මග්ගොන මාර්කට් ප්ලේස් හි බී. වී. පී. පෙරේරා, කළුතර දකුණේ ඕ. ඇස්. ඇල්පි සිංඤෝ මුදලාලි ගේ කඩය ලඟ, බී. ජෝසප් පෙරේරා, කළුතර හෝලි පැමිලි කොන්වෙන්ට්, ඇම්. ඒ. ප්‍රනාන්දු මහත්මිය, සහ නයිනමඩම ආණ්ඩුවේ දිස්පැන්සරියේ, පී. ජේ. වාස් යන අයවළුන් විසින් බලහත්කාරයෙන් අල්වා ගෙන ඇත ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 08.8.

**කැ. නො : 3.**

ඉඩමේ නම : මිල්ලගහවත්ත ; විස්තරය : අවු. 20-30 රබර් ගස් 16 ; අයිතිකරුවෝ : බී. වී. පී. පෙරේරා, මාර්කට් ප්ලේස්, මග්ගොන ඇම්. ඒ. ප්‍රනාන්දු මහත්මිය, හෝලිපැමිලි කොන්වෙන්ට්, කළුතර පී. ජේ. වාස්, රජයේ ඩිස්පැන්සරිය, නයිනමඩම, බී. ජෝෂප් පෙරේරා, ඕ. ඇස්. ඇල්පි සිංඤෝ මුදලාලිගේ කඩේ ළඟ, කළුතර දකුණ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 29.8.

එකතුව අ. 0, රූ. 1, ප. 08.2.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 සැප්තැම්බර් 5 වැනි දින පූ. භා. 9.30 ට කළුතර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අගෝස්තු 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ඇ‍ර්. ද සිල්වා,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1962 ජූනි 26 වැනි දින,
කළුතර කච්චේරිය.

7–31—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධන) පනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ගාල්ල දිස්ත්‍රික්කයේ, නැගෙනහිර බෙන්තොට වලල්ලාවිට කෝරළයේ, පිටිගල ගම්මුලාදැනි වසමට අයත්, පිටිගල නමැති ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 2ක් පමණ වන තොවේවත්ත නමැති ඉඩම් කොටසට මායිම් :—

උතුරට : එම ඉඩමේම කොටසක් ; නැගෙනහිරට : එල්. ඒ. සී. විලියම් අප්පුහාමි හිමිකම් කියන කුස්සිගෙදර වත්ත නැමති ඉඩම ; දකුණට : පිටිගල-පත්තිනිගොඩ ගම්සභාපාර ; බස්නාහිරට : පිටිගල සී. සී. විට්ටච්චි හිමිකම් කියන තොවේවත්ත නැමති ඉඩමේ කොටසක්.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ 60/61 ඊ 346 ඉට/3/225

1962 අප්‍රේල් මස 9 වන දින,
කොළඹ දී ය.

7-104—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කිණිගොඩ දෙකෝරළේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ තල්ගමුව අට්ටාපිටිය වසමේ අට්ටාපිටිය ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 11 ක් පමණවූ පහත සඳහන් මායිම්වලට මැදිවූ අඟුරුවැල්ල තැන්න නමැති ඉඩම.

උතුරට : උස්සාපිටිය-අට්ටාපිටිය ගමසභා අඩිපාර ; නැගෙනහිරට : හිඟුල-අළුපොත ප්‍රසිද්ධ පාර ; දකුණට : සොහොන්බිම සහ මහ ඔය ; බස්නාහිරට : මහඔය සහ උස්සාපිටිය-අට්ටාපිටිය ගම්සභා පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලි බල ඇමති.

යොමු අංක : ජේ 61/62 එල් 190 (විජ)/එල්. ඒ. 92.

1962.6.15 වැනි දින,
කොළඹ දීය.

7-21—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම් වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

පහත සඳහන් අන්දමට මායිම් වී ඇති, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්නා කෝරලයේ දියපොත ගම් පත්තුවේ, තුන්කම ගම්මුලාදැනි වසමේ, තුන්කම ගමේ පිහිටි කොලොන්ගස්හේන (බී. ඇස්. පී. පී. 777 තේ බිම් කැබැලි අංක 156, පරණ බිම් කැබලි අංක 8න් කොටසක්) නමැති ඉඩමෙන් ප්‍රමාණය අක්කර 1, රූඩ් 1 පර්චස් 08 ක් පමණ වන කොටසක්.

උතුරට සහ දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස් ; නැගෙනහිරට : රත්නපුර-හම්බන්තොට ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : අත්කර ගනු ලබන බෙමානන්ද ස්ථවිරයන්ට අයිති ඉඩමේම කොටසක්.

පහත සඳහන් අන්දමට මායිම් වී ඇති, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්නා කෝරළයේ දියපොත ගම්පත්තුවේ, තුන්කම ගම්මුලාදැනි වසමේ, තුන්කම ගමේ පිහිටි කොලොන්ගස්හේන (බී.ඇස්.පී.පී. 777 තේ බිම් කැබැලි අංක 156) (පරණ බිම් කැබැලි අංක 8න් කොටසක්) නමැති ඉඩමෙන් ප්‍රමාණය අක්කර 0, රූඩ් 2, පර්චස් 14.4ක් පමණ වන කොටසක්.

උතුරට සහ දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස් ; නැගෙනහිරට : අත්කර ගනු ලබන ඇම්. බී. රත්නායක මහතාට අයත් එම ඉඩමේම කොටසක් ; බස්නාහිරට : රජයේ ඉඩම.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ 61/62 එල් 155,

1962 ජූනි මස 6 වැනි දින,
කොළඹදීය.

7-154—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

අංකය : එල්එල්/ඒ 6568—ජේ 59/60 ඊ 573.

## ඉඩම් ලබාගැනීමේ ආඥාපනත (460 පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ (460 වෙනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :—

රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද කෝරළයේ, කඩවත කෝරළයේ උඩුවග්ගම් පත්තුවේ මැද ගම්මැද්ද යන ගමේ පිහිටි අංක 6 දරණ අවසාන ටෝපෝ සිතියමේ 3 වෙනි අතිරේකයේ ලොට් 13 වශයෙන් මැන විස්තරකර ඇති පහත දැක්වෙන ඉඩම්.

ලොට් : 13.

ඉඩමේ නම : මැදගම්මැද්ද ගම පුවුපාහින්න වත්ත ; විස්තරය : අවුරුදු 30 ට වඩා වයසැති තේ වගාව ; අයිතිකරුවෝ : ඇස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහත්මිය, 97, රෝස්මිඩ් පෙදෙස, කොළඹ ; ඊ. ජේ. දිවිතොටවෙල මහත්මිය, පනාන වතුයාය, යටියන්තොට ; ප්‍රමාණය : අ. 2, රූ. 0, ප. 0.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 අගෝස්තු 29 වන දින උදේ 11 ට රත්නපුර දිසාපති කායඹාලයේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1962 අගෝස්තු 21 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇම්. ඒ. මොහමඩ්,
රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වෂී 1962ක්වූ ජූනි මස 29 දින,
රත්නපුර කච්චේරියේදීය.

7-155—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

සඳහන් අංකය : එල් සී/ඒ එම්පී/3762—ජේ 57/58 එල්. 25.

මහාජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම/පරවශතාව *ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ/පරවශතාවේ* විස්තර :—

පහත සඳහන් 1387 දරණ අතිරේක මූලික පිඹුරේ 1 සිට 9 දක්වා වූ කට්ටි

**කට්ටි අංක : 1.**
ඉඩමේ නම: මෙරවලන්ද මලයාඩිකන්දම් ; විස්තරය : කුඹුර ; අයිතිවාසිකම් කියන්නෝ : රජයේ සහ කේ. ෂරීප්තම්බි ; ප්‍රමාණය : අ. 2, රූ. 3, ප. 11.0.

**කට්ටි අංක : 2.**
ඉඩමේ නම : කුලාඩිවද්දායි මලයාඩිකන්දම් ; විස්තරය : කුඹුර ; අයිතිවාසිකම් කියන්නෝ : රජයේ සහ ඉරක්කමම්හි අලියාර් කලන්දර් ; ප්‍රමාණය : අ. 6, රූ. 1, ප. 33.0.

**කට්ටි අංක : 3.**
ඉඩමේ නම : කුලාඩිවද්දායි මලයාඩිකන්දම් ; විස්තරය : කුඹුර ; අයිතිවාසිකම් කියන්නෝ : රජයේ ; ප්‍රමාණය : අ. 1, රූ. 1, ප. 28.0.

**කට්ටි අංක : 4.**
ඉඩමේ නම: කච්චේකුඩි මලයාඩිකන්දම් ; විස්තරය : කුඹුර ; අයිතිවාසිකම් කියන්නෝ : රජයේ ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 29.0.

**කට්ටි අංක : 5.**
ඉඩමේ නම: කච්චේකුඩි මලයාඩිකන්දම් ; විස්තරය : කුඹුර ; අයිතිවාසිකම් කියන්නෝ : රජයේ සහ කලන්දර් ; ප්‍රමාණය : අ. 2, රූ. 1, ප. 10.0.

**කට්ටි අංක : 6.**
ඉඩමේ නම: කච්චේකුඩි මලයාඩිකන්දම් ; විස්තරය : කුඹුර ; අයිතිවාසිකම් කියන්නෝ : ආදම්ලෙබ්බේ, ඉරක්කමම් ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 20.0.

**කට්ටි අංක 7.**
ඉඩමේ නම : කුලාඩිවත්තායි මලයාඩිකන්දම් ; විස්තරය : කුඹුර ; අයිතිවාසිකම් කියන්නෝ : රජයේ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 15.0.

**කට්ටි අංක : 8.**
ඉඩමේ නම : හෙලබොඩ ඉලුක්කුවද්දායි ; විස්තරය : කුඹුර සහ වේල්ල ; අයිතිවාසිකම් කියන්නෝ : රජයේ ; ප්‍රමාණය : අ. 2, රූ. 2, ප. 19.0.

**කට්ටි අංක : 9.**
ඉඩමේ නම : හෙලබොඩ ඉලුක්කුවද්දායි ; විස්තරය : වේල්ල ; අයිතිවාසිකම් කියන්නෝ : රජයේ සහ දමන, සී. ඇම්. සුදුමැනිකාගේ ; ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 18.0.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට/පරවශතාවට *සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 අගෝස්තු මස 17 දින හිඟුරාන සංචාරක බංගලාවේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම/පරවශතාව *පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 අගෝස්තු 10 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

අම්පාරේ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1962 ජූනි මස 28 දින,
උහන කච්චේරිය.

7-158—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

**33 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

අංකය 3/61/42

මහී ලයනල් ජෝෂප් වික්‍රමරත්න කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත වන මම, ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 33 වෙනි වගන්තිය යටතේ, මෙහි උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩමේ වන්දි මුදල වන රුපියල් තුන්සිය විස්සක් (රු. 320) ඊට හිමිකම් ඇති අයවලුන් විසින් ලබාගැනීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික් උසාවියේ තැන්පත් කරන්ට යෙදුන බව මෙයින් දනුම් දෙමි.

ඇම්. ඇල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1962ක්වූ ජූනි මස 30 දින,
කුරුණෑගල කච්චේරියේදීය.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, තිත්තවැල්ල නමැති ගමෙහි පිහිටි නො. ඒ 1709 දරණ මූලික සැලැස්මේ මැන වඩා විස්තරව හැඳින්වෙන කැබැලි අංක 5, 6 සහ 8 දරන අ. 0, රූ. 1, ප. 23.2ක් විශාලත්වයක් ඇති කෙත, මැනුම් කුඹුර, සහ ගලහිටියාව නමැති ඉඩම්වලින් තුනෙන් දෙපංගුව.

7-191—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## කෑගලු දිස්ත්‍රික්කයේ පරණකූරු කෝරළයේ රහල ගමේ අංක පීපීඒ. 1069 දරණ සැලැස්මේ අංක 1-4 දක්වා ඇති බිම් කට්ටිවල පිහිටි වගාවන්ගේ ප්‍රයෝජන බුක්ති විඳීමේ අයිතියේ බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකිණීමේ දැන්වීමයි

කෑගලු දිස්ත්‍රික්කයේ පරණකූරු කෝරලයේ රහල ගමේ පිහිටි අංක 1029 දරණ සැලැස්මේ අංක 1-4 දක්වා අක්කර 4 රූඩ් 3 පර්චස් 01.2 ක ප්‍රමාණය ඇති බිම් කට්ටිවල පිහිටි වගාවන්ගේ පල ප්‍රයෝජන ගැනීමේ අයිතිය 1962 කේ ජූලි 1 වෙනි දින සිට 1962 කේ දෙසැම්බර් 31 වෙනි දින දක්වා මාස 6 ක කාලය සඳහා බද්ද 1962 කේ ජූලි මස 24 වෙනි දින පෙරවරු 10 ට අරණායක පොලිසිය අසලදී කෑගල්ලේ දිසාපතිතැන (පසුව දිසාපති කියනු ලබන) විසින් හෝ දිසාපතිපතිතැන විසින් බලය පවරණලද ඕනෑම නිලධාරියෙක් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරණු ලැබේ.

2. වෙන්දේසියෙන් බද්ද ඉල්ලීම වාර්ෂික බදු මුදල් අනුව මාස 6 සඳහා තක්සේරු කරණලද බදු මුදලවන රු. 130.00 ට අඩුවෙන් භාරගනු නොලැබේ.

3. රජයේ දිසාපති (බලයලත් වෙන්දේසි කරණ නිලධාරීතැන) විසින් යම් ඉල්ලීමක් අනුමත කිරීමට ප්‍රථම බදු බලපත්‍රයේ කොන්දේසි යථා පරිදි පිළිපැදීමට ශක්තියක් ඇති කෙනෙක්ද යනු පිළිගැනීමෙන් පසුව ඉල්ලීම භාරගනු ලැබේ. එසේ නොපිළිගන්නේ නම් දිසාපතිතැන හෝ බලයලත් නිලධාරිතැන විසින් ඕනෑම ඉල්ලීමක් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂෙපකර බද්ද ඉවත්දේසි කරගෙන යනු ලැබේ.

4. සියළුම ඉල්ලුම් කරුවෝ තම තමා විසින් හෝ බලයලත් නියෝජිතයන් ඇත්නම් ඒ අයද ඉහත සඳහන් වේලාවට නියමිත ස්ථානයට පැමිණ සිටිය යුතුය. වෙන්දේසිය පටන් ගැනීමට ප්‍රථම ඉල්ලීමට බලයලත් නියෝජිතයන් විසින් ඔවුන්ට බලය පවරා ඇති ලිපි පරීක්ෂාකර බැලීම සඳහා වෙන්දේසි කරණ නිලධාරීතැනට ඉදිරිපත් කළයුතුයයි.

5. පිළිගත් ඉල්ලුම්කරු විසින් ඔහුගේ ඉල්ලීම පිළිගත් වහාම මාස 6 යේ බදු මුදලේ අත්තිකාරම් මුදල වශයෙන් පිළිගන්නා ලද බදු මුදලින් 1/3 ක් දිසාපතිතැනට හෝ වෙන්දේසිය මෙහෙයවන නිලධාරිතැනට ගෙවිය යුතුයි. ඉතිරි මුදල වෙන්දේසිකළ දිනයේ සිට සති 2ක් ඇතුලත ගෙවා අවසන්කළ යුතුයි. ඉල්ලනලද මුදලින් 1/3 ක් ගෙවීමට හෝ සති 2 ක් ඇතුලත ඉතිරි මුදලද ගෙවා අවසන් කිරීමට අපොහොසත්වූ ඉල්ලුම්කරුගේ ඉල්ලීම අවලංගුකර ගෙවාඇති යම් මුදලක් ඇත්නම් රාජසන්තක කිරීමට දිසාපතිතැනට බලය තිබේ.

6. ඉල්ලුම්කරු විසින් ඉල්ලනලද බදු මුදල ගෙවා අවසානයේදී ඉඩමේ බුක්තිය භාරදී පහත සඳහන් අමතර කොන්දේසිද ඇතුලත් බදු බලපත්‍රයක් ඔහුට නිකුත් කරනු ලැබේ :—

(අ) දිසාපතිතැනට ඕනෑම අවස්ථාවක මාසයක් කල්දී බදු බලපත්‍රය අවලංගුකළ හැකිය. එසේ අවලංගු කිරීම සඳහා නිකුත් කරණ නිවේදනය බලපත්‍ර ලාභියාට පුද්ගලික වශයෙන් භාරදී හෝ ඔහුගේ ලිපිනයට ලියාපදිංචිකළ තැපැලෙන් යවා හෝ ඉඩමේ කාටත් පෙණෙන ස්ථානයක අලවා හෝ දැන්විය හැකිය,

(ආ) බලපත්‍ර ලාභියා විසින් ඉඩම කිසිවෙකුට බදු දීමක් හෝ පැවරීමක් හෝ උගස් කිරීමක් හෝ වෙනයම් ක්‍රමයකට බුක්ති විඳීමට ඉඩදීම තහනම්ය,

(ඇ) බලපත්‍ර ලාභියා විසින් හෝ ඔහුගේ කුලී කරුවන් විසින් හෝ ඉඩමේ පිහිටි ගස් කැපීමක් හෝ ගස්වලට හානි කිරීමක් දිසාපතිතැනගේ අනුමතිය ලියවිල්ලකින් ලබා ගෙන මිසක් නොකළයුතුය,

(ඈ) දිසාපතිතැන සතුටුවන පරිදි බලපත්‍ර ලාභියා විසින් ඉඩම ලදු කැලෑවෙන් තොරව තබාගතයුතුයි,

(ඉ) දිසාපතිතැන සතුටුවන පරිදි ඉඩමේ වගාවන් බලපත්‍ර ලාභියා විසින් ඉතා යහපත් තත්ත්වයකට තබාගතයුතුයි,

(ඊ) දිසාපතිතැනගෙන් ලියවිල්ලකින් අවසරය ලබාගෙන මිසක් බලපත්‍ර ලාභියා විසින් හෝ ඔහුගේ කුලීකරුවෝ විසින් ඉඩමේ පස් කැපීමාදිය නොකළයුතුය,

(උ) දිසාපතිතැනගෙන් ප්‍රථමයෙන් ලියවිල්ලකින් අවසර ලබාගෙන මිසක් බලපත්‍ර ලභියා විසින් ඉඩමේ කිසිම මඩුවක් හෝ ගොඩනැගිල්ලක් ඉදිනොකළයුතුයි. එසේ ඉදිකිරීමට කිසි වෙකුට ඔහු විසින් ඉඩ නොදිය යුතුයි,

(ඌ) බලපත්‍ර ලාභියා විසින් කිසිම ගව මහිසාදි සතුන් ඉඩමට ඇතුල් නොකළයුතුයි. එසේම එම සතුන්ට ඉඩමේ දඩාවතේ හැසිරෙන්ට ඉඩ නොදියයුතුයි,

(එ) දිසාපතිතැනට හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකුට ඕනෑම අවස්ථාවක ඉඩමට ඇතුල්වීමට හා ඉඩම පරීක්ෂා කිරීමට බලය තිබේ.

(ඒ) බලපත්‍ර ලාභියා විසින් ඉඩම සඳහා ගෙවියයුතු සියලුම අයබදු, වරිපනම් ආදි බදු මුදල් ගෙවිය යුතුයි.

(ඔ) බලපත්‍රයේ ඕනෑම කොන්දේසියක් කඩකළහොත් දිසාපති තැනගේ නියෝගයක් අනුව බලපත්‍රය අවලංගු කළ හැකිය,

(ඕ) ඉඩම දියුණු කළාට හෝ ඉඩම දියුණු කිරීම සඳහා වියදම් කළාට හෝ අලාභ සඳහා වන්දි මුදලක් හෝ මොනම අලාභයක් සඳහා වන්දි මුදලක් අයකරගැණීමට බලයක් බලපත්‍ර ලාභියාට නැත,

(ක) බලපත්‍රයේ සඳහන් කාල සීමාවේ අවසානයේදී හෝ ඊට ප්‍රථම අවලංගුකළ අවස්ථාවේදී බලපත්‍ර ලාභියා විසින් ඉඩමේ නිරවුල් අයිතිය දිසාපතිතැනට හෝ ඒ සඳහා දිසාපතිතැන විසින් බලය පවරනලද නිලධාරිතැනට භාරදිය යුතුයි,

(ඛ) මෙසේ වෙන්දේසියෙන් ඉල්ලා බදු ගැණීම උඩ නිකුත්කරන ලද මෙම බලපත්‍රය යටතේ බලපත්‍ර ලාභියාට මෙම ඉඩම සඳහා අනුග්‍රාහික බද්දක් ඉල්ලීමේ කිසිම අයිතියක් නොමැත,

7. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වෙනත් විස්තර කෑගල්ලේ දිසාපතිතැනගෙන් ලබාගත යුතුයි.

ජේ. ජේ. ජී. අම්ර්තනායගම්,
කෑගල්ලේ දිසාපතිතැන.

1962 ජූනි මස 27 දින,
කෑගල්ලේ කච්චේරියේදීය.

7-70—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

එල්. ආර්. 369/එල්.පී. 1988.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලේ මැදපත්තුවේ තල්ගස්මොටේ ගමෙහි පිහිටි 14,022 දරණ මූලික සිතියමේ අංක ජී. 905 දරණ බිම් කට්ටියෙන් ප්‍රමාණයෙන් අක්කර (½) බාගයක් පමණවූ රජයේ බිම් කැබෙල්ලක් සමාජ ශාලාවක් ඉදි කිරීම සඳහා වේයන්ගොඩ රජයේ සේවකයින්ගේ ක්‍රීඩා සමාජයේ භාරකාරයින්වන—වේයන්ගොඩ පන්නල ගෙදර "ඇල්ප්‍රඩ් හවුස්හි" ආර්. සී. ද ඇස්. මනුකුලසූරිය, වේයන්ගොඩ පන්නල ගෙදර අංක 441 දරණ ස්ථානයෙහි ඩී. බැසිල් ප්‍රනාන්දු සහ වේයන්ගොඩ කුරීකොටුව, උඩගම පදිංචි කේ. සී. ගුණවර්ධන යන මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් නිවේදනය කෙරේ.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලටද යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස්කොට ඇත :—

(අ) කාලය : අවුරුදු 30 යි.

(ආ) බද්ද : අවුරුද්දකට රු. 2.50 යි.

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ආරම්භවූ දින සිට අවුරුදු දෙකක් ඇතුලතදී කොළඹ දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි ටැනිස් පිටි දෙකක්ද, බෙඩ්මින්ටන් පිටියක්ද, සමාජශාලා ගොඩනැගිල්ලක් තනා නිම කළ යුතුයි.

ඈ) බදු ගන්නන් විසින් මෙම ඉඩම වේයන්ගොඩ සමාජශාලාව සඳහා පිණිස මිස වෙන අන්‍ය කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලත මෙම ඉඩම බදු නොදීය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1962 ජූලි මස 6 දින,
කොළඹදීය.

7-178—62.7.6 දින අංක 13,200 දරන ගැසට් පත්‍රය

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඞ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. **පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් **එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.**

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද, සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් **ගණුදෙනු කාලය අවසන් වේ.**

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ **ප්‍රකාශනයන්** එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දොස් වලක්වා ගැනීම සඳහා පළ කරන්ට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ **නම් වෙනස් කිරීම පිළිබඳ** කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. **උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.**

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 | 0 |

**අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.**

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින හතරකට **ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පසවරු 3.30ට ප්‍රථමයෙන්).**

13. දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| එක්කොටසක් ... ... ... | 22 | 50 | ... | 35 | 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 12 | 50 | ... | 18 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 20 | 0 | ... | 28 | 0 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක් ... ... ... | 0 | 25 | ... | 0 | 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 | 50 | ... | 0 | 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 10 | ... | 0 | 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 20 | ... | 0 | 15 |

**දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවනු ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි